**ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය - 2019**
**--------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**--------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මාණ්ඩලික විද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යාලයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අදාල ප්‍රමිතයට අනුව යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින පිරිවැය රු.77,022,102 ක් වූ ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීව කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් එම ස්ථාවර වත්කම් වල ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ගිණුම්ගත කර නොතිබුණි. | 2018 සැප්තැම්බර් සිට තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකර නව අගයන් 2020 ජනවාරි සිට බලපැවැත්වෙන බැවින් 2020 ගිණුම් වල ගැලපීමට කටයුතු කිරීමට නියමිත බව. | දේපල පිරියත හා උපකරණ විධිමත්ව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ප්‍රකාරව මාණ්ඩලික විද්‍යාලයේ සේවකයින්ට පාරිතෝෂිත දීමනා සදහා 2009 වර්ෂයේ සිට ප්‍රවර්තන වර්ෂය දක්වා රු.5,996,988 ක වෙන් කිරීම් සිදුකර නොතිබුණි. | ඉවත්වන සේවකයින් සදහා පාරිතෝෂිත දීමනා ගෙවීම් සිදුකර නොමැති අතර ඉදිරියේදී විද්‍යාලයේ වැටුප් හා දීමනා ප්‍රතිපාදන තුලින් මුදල් ගෙවීමට නියමිතය. දැනට පාරිතෝෂිත හිමිකම් ඇති ඉවත්වූ සේවකයින් 8 ක් සිටින අතර ඔවුන්ට ප්‍රතිලාභ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | සේවක පාරිතෝෂිත පනත හා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව කටයුතු කරමින් පාරිතෝෂිත ගෙවීම සදහා ප්‍රතිපත්තියක් සකස් කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)අයෝග්‍ය කර වෙන්දේසි කිරීම සදහා නිර්දේශ කරන ලද වාහන 6 ක ප්‍රත්‍යාගණන වටිනාකම වූ රු.6,250,000 ක් සහ සමුච්චිත ක්ෂය රු.1,250,000 ක් දේපල පිරියත ගිණුමෙන් ඉවත් කර තිබුණි. ඒ අනුව ඒකාබද්ධ අරමුදල රු.5,000,000 කින් අවතක්සේරු වී තිබුණි. එසේම යුධ හමුදාවට අයත් රු.1,050,000 ක් වටිනා UHA 7436 ටාටා ට්‍රක් රථය 2018 මැයි 03 දින යුධ හමුදාව වෙත භාරදී ඇතත් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර තිබුණි. | 2019 වර්ෂයේ ප්‍රයෝජනයට නොගෙන ඇති නිසා වර්ෂයේ ක්ෂය බලපෑම ඇතුලත් නොවිය යුතු බැවින් ප්‍රත්‍යාගනන වටිනාකම හා සම්මුච්චිත ක්ෂය මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කරන ලදී. UHA 7436 ටාටා ට්‍රක් රථය යුධ හමුදාව වෙත භාරදී ඇති අතර සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වන බැවින් ක්ෂය බලපෑමක් නොමැති අතර ප්‍රමාද දෝෂයක් නිසා වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට නොහැකි වී තිබුණු බව. | වත්කම් ගිණුම් තැබීමේදී එහි අයිතිය හා භෞතික පැවැත්ම පිළිබද තහවුරු කරගෙන ගිණුම් තැබීමට කටයුතු කල යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,940,105 ක් වටිනා ලිපිද්‍රව්‍ය තොගය ගිණුම්ගත කර නොතිබුණි. | ලිපිද්‍රව්‍ය තොගයේ වටිනාකම 2020 වර්ෂයේ අවසන් ගිණුම්වලට ගැලපීමට කටයුතු කරන බව. | විද්‍යාලයේ සියලු තොගයන් හදුනාගෙන ගිණුම් ගත කල යුතුය. |
| (ඇ)මාණ්ඩලික විද්‍යාලයේ සේවකයින් වෙනුවෙන් 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සේවක භාර අරමුදල් සදහා ගෙවිය යුතු රු.4,819,548 ක් ගිණුම් ගත කර නොතිබුණි. | සේවා නියුක්ත භාර අරමුදලේ දායකත්වය ලබාගෙන දායක මුදල් ගෙවීමට ඉදිරියේදි කටයුතු සිදු කරන බව. | සේවක භාර අරමුදල් පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)විද්‍යාලයේ කටයුතු සඳහා වෙනත් රාජ්‍ය ආයතන වලින් ලබාදී තිබුණු රු.20,900,000 ක් වටිනා වාහන 12 ක් මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කර ඇතත් මේ දක්වා අයිතිය පවරාගෙන නොතිබුණි.ඒ සඳහා 2019 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය රු.19,640,000 ක් වෙන් කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව | අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා යුධ හමුදාවට ගෙවිය යුතු වසර පහකට වැඩි කාලයක සිට පවතින රු.10,992,853 ක ණය ශේෂය පියවීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් ඇති බව. | දිගුකාලීන ණයශේෂ පියවීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීතී,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)මාණ්ඩලික විද්‍යාලයේ 2012 අංක 13 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලීය (සංශෝධන) පනත හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය | සිවිල් පරිපාලන කටයුතු සඳහා සිවිල් පරිපාලන නිලධාරියෙකු හා විගණන කටයුතු සඳහා ස්ථිර අභ්‍යන්තර විගණක වරයෙකු පත්කල යුතු වුවත් වසර ගණනාවක සිට මෙම තනතුරු දෙක සඳහා ස්ථිර නිලධාරීන් පත්කර නොතිබුණි. | සිවිල් පරිපාලන හා අභ්‍යන්තර විගණක සඳහා ඇති ස්ථිර තනතුරු වලට නිලධාරීන් පත්කර දෙන ලෙස අමාත්‍යාංශයේදී අවස්ථා ගණනාවකදී ඉල්ලුම් කර ඇති අතර ඉදිරියේදී පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ)1983 අංක 12 දරන පාරිතෝෂිත සේවා පනත | ඉවත් වූ සේවකයින් 08 දෙනෙකු සඳහා පාරිතෝෂිත ගෙවීම් කර නොතිබුණි. | ඉදිරියේදී පාරිතෝෂිත ගෙවීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ)1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත | 2009 වර්ෂයේ සිට දායක මුදල් ගෙවීම් කර නොතිබුණි. | ඉදිරියේදී දායක මුදල් ගෙවීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 14,159,391 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,492,910 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,652,301 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම රු.20,612,866 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවනතා විශ්ලේෂණය**

-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.20,612,866 කින් වර්ධනය වී තිබීමට මූලික හේතුව සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර ලැබීම් රු.23,699,172 කින් එනම් සියයට 18 කින් ඉහල ගොස් තිබීම මෙයට හේතු වී තිබුණි. එසේම විද්‍යාලයේ මෙහෙයුම් වියදම් පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.5,414,319 ක් එනම් සියයට 3.5 කින් ඉහල ගොස් තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

සමාලෝචිත වර්ෂයේදී විද්‍යාලය විසින් පවත්වා තිබූ පාඨමාලාව සඳහා නිළධාරීන් 160 දෙනෙකු සහභාගි වූ අතර ඉන් 157 දෙනෙකු එම පාඨමාලාව සම්පූර්ණ කර තිබුණි.ඒ අනුව එක් නිළධාරියෙකු වෙනුවෙන් රු.1,421,495 ක වාර්ෂික පිරිවැයක් දරා තිබුණි.එසේම පසුගිය වර්ෂයේදී නිළධාරීන් 140 ක් අතරින් 136 දෙනෙකු පාඨමාලව සම්පූර්ණ කර තිබුණු අතර එක් නිළධාරියෙකු වෙනුවෙන් රු.1,641,280 ක පිරිවැයක් දරා තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව නිළධාරීන් 21 දෙනෙකු වැඩියෙන් සහභාගි කරගෙන එක් නිළධාරියෙකු වෙනුවෙන් දරා ඇති පිරිවැය රු.219,785 කින් අඩුකර ගැනීමට විද්‍යාලයට හැකි වී තිබුණි.

**3.1 ප්‍රසම්පාදන කළමනාකරණය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂය තුලදී ඇලුමීනියම් මදුරුදැල් සවිකිරීම, බැරක්ක භාණ්ඩ සහ ව්‍යායාම උපකරණ මිලදී ගැනීම යනාදී ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා රු.3,947,772 ක් හා දේශන ගාස්තු, | විද්‍යාලයීය ආයතන සභාපති ගිණුම මගින් වැය දරා ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත භාණ්ඩ මිලදී ගෙන ඇත්තේ වඩා උසස් තත්ත්වයෙන් හා ප්‍රමිතයෙන් යුතු භාණ්ඩ මිලදී ගැනීම සඳහා වන | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීමෙන් ආයතනික ප්‍රසම්පාදන කටයුතු |

| | | |
|---|---|---|
| වාහන අලුත්වැඩියාව, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව වැනි පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු.15,881,354 ක් විද්‍යාල ආයතන සභාපතිගේ ගිණුම මගින් දරා පසුව ප්‍රතිපූර්ණය කර තිබුණි. | අතර වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් වෙතින් අඩු මිලට භාණ්ඩ මිලදී ගැනීම සඳහාත් ණය පදනම මත භාණ්ඩ ලබානොදෙන බැවින් විද්‍යාලයේ සියලුම නිලයන්ගේ සුභසාධන කටයුතු සඳහා විද්‍යාලය වෙතින් ප්‍රතිපූර්ණ කිරීමේ පදනම මත භාණ්ඩ මිලදී ගෙන ඇති බව. | විධිමත්ව සිදුකිරීමට කටයුතු කල යුතුය. |
| (ආ)භාවිතයෙන් ඉවත් කර තිබුණු යන්ත්‍රයක් සඳහා මිලදීගත් රු.229,000ක් වටිනා මාස්ටර් රෝල් 22 හා කාට්ට්‍රිජ් 22 ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. | අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන බැවින් අයෝග්‍ය කිරීමට තීරණය කර ඇති අතර එම යන්ත්‍රය සඳහා මිලදී ගත් මාස්ටර් රෝල් හා කාට්‍රිජ් වෙනත් යන්ත්‍රයක් සඳහා භාවිතා කල නොහැකි නිසා ආයෝග්‍ය කිරීමේ මණ්ඩලයක් වෙත යොමු කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව අලෙවියෙන් පසු සපයන සේවා පිළිබඳ සැලකිලිමත් විය යුතුය.එමෙන්ම අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන භාණ්ඩ මිලදීගත යුතුය. |

## 3.2 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 වර්ෂයේදී විද්‍යාලය වෙත පවරා තිබුණු ජාතික තරුණ සේවා සභාවට අයත් හෙයියන්තුඩුව ප්‍රදේශයේ පිහිටි ඉඩම් අක්කර 11 ක් සහ විද්‍යාලයේ කටයුතු සඳහා යොදාගනු ලබන ආරක්ෂක අමාත්‍යාංශයට අයත් බස්රථය හා ශ්‍රී ලංකා යුධ හමුදාව වෙතින් ලබාදී තිබුණු වෙනත් වාහන 11 ක් 2019 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. | ජාතික තරුණ සේවා සභාවට අයත් හෙයියන්තුඩුව වත්ත හා බස් රථය විද්‍යාලයට පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින අතර යුධ හමුදාවේ වාහන බොහොමයක් වසර 20 කට වඩා පැරණි බැවින් ඒවා විටින් විට අයෝග්‍ය කිරීමට යුධ හමුදාව වෙත භාරදීමට කටයුතු කර ඇති අතර බොහොමයක් වාහන ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමට පත්ව ඇති බැවින් පවරා ගැනීමේ ආර්ථික වාසියක් නොමැති බව. | විද්‍යාලයට අයත් භූමියේ අයිතිය තහවුරු කර වටිනාකම තක්සේරු කිරීම හා ආරක්ෂක අමාත්‍යාංශයට හා යුධ හමුදාවට අයත් වාහන විද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පනත ප්‍රකාරව මාණ්ඩලික විද්යාලයේ කාර්යක්ෂමව ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍යවන මහාචාර්ය පදවි, ආචාර්ය පදවි හා වෙනත් තනතුරු ඇති කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක්ම අධ්‍යයන කාර්ය මාණ්ඩලයේ එම උසස් තනතුරු සඳහා පත්කිරීම සිදුකර නොතිබුණි | අදහස් දක්වා නොමැත. | විශ්ව විද්‍යාලයේ අරමුණු මානව සම්පත සංවර්ධනය කිරීම වන හෙයින් පාඨමාලාවේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගෙන පවත්වා ගෙන යාම අවශ්‍ය වේ. |